## 2021 ජුනි මස 22 වන දින පැවති

### තිස් අට වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව

**දිනය :-2021.06.22**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **17.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **18.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **20.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **21.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නා ලද අතර මීට පෙර සභාවේ ලේකම් ධූරය හෙබවූ යූ.ඒ ධම්මික මහතා රඹෑව ප්‍රාදේශීය සභාවේ, ලේකම් ලෙස පත් වී ගිය බවත්. මේ වන විට මෙම සභාවේ ලේකම් ධූරය සඳහා මීට ඉහතදී ම.නු.ප ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරය දැරූ හා ආණ්ඩුකාර කාර්යාලයේ පරිපාලන නිළධාරීයා ලෙස සේවය කල ප්‍රදීප් නිශාන්ත මහතා පත් කර එවා ඇති බවත්,සඳහන් කරමින් නව ලේකම් වරයා හඳුන්වා දෙන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2021.05.21 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.05.21 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.05.21 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ඩී විමලසිරි මැතිතුමා 2021.05.21 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

සංශෝදන

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ප්‍රාදේශීය සභාවේ මීට පෙර ලේකම් ධූරය හොබවමින් සිටි යූ.ඒ ධම්මික මහතා ස්ථාන මාරුව සම්බන්ධයෙන් දැනුවත් වීමක් නොමැති වුවත්, වසර ගණනාවක් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උන්නතිය, සභාවේ නෛතික ආරක්ෂාව වෙනුවෙන් විශාල කැපකිරීමක් කල වගකීමක් සහිත රජයේ නිළධාරියෙකු ලෙස එතුමා කල සේවයට ගෞරවය හා ස්තූතිය පුද කරන ලදී.

තවද නව ලේකම්වරයා ලෙස පත් වී සිටින ප්‍රදීප් නිශාන්ත මහතා ගෞරවයෙන් පිළිගනිමින්, එතුමා වෙතද ජනතා හිතකාමී ලෙස නෛතික රාමුව තුල රාජකාරි ඉටු කිරීම සඳහා ශක්තිය ධෛර්ය හිමි වේවායිත් ප්‍රාර්ථනය කරමින් 2021.05.21 වන දින සභා වාර්තාව සම්බන්දයෙන් පැවති සංශෝධන ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2021.05.21 මහ සභා වාර්ථාවේ, කඩ කාමර සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඩී. පී බන්දුලසේන මැතිතුමා විසින් කරනු ලද ප්‍රකාශයේ 1997 මැතිවරණයට පෙර එ.ජා.ප ආණ්ඩුව විසින් 7 ඇල සකස් කරනු ලැබූ කඩ කාමර ආණ්ඩුව වෙනස් වීමත් සමඟ බලහත්කාරයෙන් අත්පත් කර ගත් බවත්, යන ප්‍රකාශය 1997 පළාත් පාලන මැතිවරණයට පෙර එ.ජා.ප ආණ්ඩුව විසින් 7 ඇල සකස් කරනු ලැබූ කඩ කාමර ආණ්ඩුව වෙනස් වීමත් සමඟ බලහත්කාරයෙන් අත්පත් කර ගත් බවත් ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද කඩ කාමර සම්බන්ධයෙන් තමන් බෙදීමක් ඉල්ලූ නමුත් එය විරුද්ධ වූ බවට සඳහන් කර ඇති බැවින් එය සංශෝධනය කරන ලෙසත්, බෙදීම ඉල්ලන අවස්ථාවේදී විරුද්ධ වීමට අදාල හේතු ප්‍රකාශ කල බවත්, ගිවිසුම සම්බන්ධයෙන් අදාල විරුද්ධ වීම සිදු කල බවත්, ගිවිසුම පිටපත් කර ගැනීමේදී අනුරාධපුර මහ නගර සභාව ලෙසට පැවති ස්ථාන ගිවිසුම තුල සඳහන් වීම සංශෝධනය කල යුතු බවට ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සඳහනක් කලත් එවැනි ප්‍රකාශයක් සභා වාර්ථාව තුල ඇතුලත් වී නොමැති බවත්, සභාවේ නීතිඥ මහතාගේ නීති උපදෙස් රැගෙන සංශෝධනය කරන ලද නිවැරදි ගිවිසුම සභාවට ඉදිරිපත් කරන ලෙසට අදහස් දැක්වූවත්, ගරු සභාපතිතුමා එයට එකඟ නොවීම මත බෙදීම ඉල්ලූ බවත්, ඒ අනුව එදින සම්මත වූයේ නිවැරදි ගිවිසුම නොවන බව පැහැදිළි වන බවත්, සඳහන් කරන ලදී.

තවද 10 වන යෝජනාව තුල කොරෝනා වසංගතය වැළදෙන සභා සේවකයින් වෙත හා සභිකයින් වෙත රු 5,000 ක සහන මල්ලක් ලබා දීම යන ප්‍රකාශය කොරෝනා වසංගතය වැළදෙන සභා සේවකයින් වෙත හා ගරු සභිකයින් වෙත රු 5,000 ක සහන මල්ලක් ලබා දීම ලෙසටත්, යෝජනාව තුල රු 5,000 ක් ලෙස සටහන් වුවත්, යෝජනාව සම්මත වීමේදී රු 500 ක් ලෙස දැක්වීම සංශෝධනය වි යෝජනාව සම්මත වන ස්ථානයේ රු 5,000 ලෙස ට සටහන් විය යුතු බවත්, එහි ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේද යන්න විමසූ අතර යන ප්‍රකාශය ගරු සභාපති එස්.බී කුමාරදාස

මැතිතුමා ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ඉදිරිපත්කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර ලෙසට සංශෝධනය විය යුතු බව ද සඳහන් කරන ලදී.

තවද රුස්වීම් කැඳවීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම තුල තමන් කරන ලද ප්‍රකාශයෙහි මරණ ප්‍රතිශතය හා ආබාදිත සංඛ්‍යාව දිනෙන් දින ඉහල යන බවත්, යන ප්‍රකාශය මරණ ප්‍රතිශතය හා ආසාදිත සංඛ්‍යාව දිනෙන් දින ඉහල යන බවත් ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තව දුරටත් සංශෝධන ඉදිරිපත් කල ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා කොවිඩ් නොමැති සමාජයක් ඉදි කිරීම සඳහා වන වැඩ පිළිවෙල කඩිනම් කරන ලෙසත් යන ප්‍රකාශය කොවිඩ් නොමැති සමාජයක් ඇති කිරීම සඳහා වන වැඩ පිළිවෙල කඩිනම් කරන ලෙසත් ලෙසට සංශෝධනය විය යුත බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කඩ කාමර දීර්ඝ කාලීන ව බදු දීම සම්බන්ධයෙන් වන යෝජනාව තුල ඉදිරිපත් කල සංශෝධන ගරු සභාපතිතුමා විසින් පිළිනොගැනීම මත ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා යෝජනාවට විරුද්ධව බෙදීමක් ඉල්ලා සිටි අතර ඒ සඳහා ඇතැම් ගරු සභිකයින් විරුද්ධත්වය ප්‍රකාශ කල නමුත් බෙදීමක් ඉල්ලීම සඳහා හේතු වූ කරුණු සභා වාර්තාව තුල නොමැති නිසා සංශෝධන ඉදිරිපත් කරන බවත්, මෙම සභා වාර්තාව පරිශීලනය කිරීමේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොඳම සභාව හා සභා වාර්තාව මෙය වන බවට පැහැදිලි වන නමුත් සාකච්ඡා කල හොඳ කරුණු වාර්තාව තුල ඇතුලත් වී නොමැති බැවින් සභා වාර්තාවට තමන් විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා එදින ගරු සභාවේදී ගිවිසුම සම්බන්ධයෙන් නීතිඥ උපදෙස් රැගෙන පවතින අඩු පාඩු සංශෝධනය කර නැවත සභාවට ඉදිරිපත් කර සභා සම්මත කර ගන්නා ලෙසට සඳහන් කර යෝජනාවට විරුද්ධ වූ නිසා, එම අඩුපාඩු සකස් කර නීතිඥ උපදෙස් මත ගිවිසුම සකස් කරන බව ප්‍රකාශ කරමින් අදාල යෝජනාව සම්මත කර ගත් බවත්, එහිදී ඉදිරිපත් කල සංශෝධන තමන් පිළිගත් බවත්, සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.05.21 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මේ යටතේ තමන් දිගින් දිගටම 2021 වර්ෂයට අදාලව හියුම් පයිප්ප ස්ථානගත කිරීම සම්බන්ධයෙන් වූ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම් කලත් මේ වන තෙක් ලබා නොදුන් බැවින් එය ලබා දීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඊළඟ මහ සභාවේදී අදාල විස්තර වාර්තාව අනිවාර්යෙන්ම ලබා දීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.06.10 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. බෝ වන රෝග නිවාරණය**

බෝ වන රෝග නිවාරණය යටතේ බල ප්‍රදේශයේ ජනතාවට එන්නත් කිරීම වෙනුවෙන් 2021.06.10 වන දින සහභාගී වූ නිළධාරීන්ට දිවා ආහාරය හා එන්නත් ලබා ගත් පුද්ගලයින් වෙත තේ ලබා දීම වෙනුවෙන් වූ වියදම් ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල (රු) | සම්පූර්ණ වටිනාකම |
|---|---|---|---|---|
| 01 | නෙස්කැෆේ තේ සඳහා | 400 | 30.00 | 12,000.00 |
| 02 | දහවල් කෑම | 20 | 200.00 | 4,000.00 |
| 03 | යෝගට් | 25 | 35.00 | 875.00 |
| | | | එකතුව | 16,875.00 |

අදාල කාර්යය සිදු කිරීම අත්‍යාවශ්‍ය වන බැවින් රු 16,875.00 ක වියදම් ඇස්තමේන්තුවට අදාලව සභා අරමුදලින් වියදම් දැරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා 2021.06.10 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා පවතින්නේ ද යන්න විමසන ලදී. ඒ අනුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 ජුනි මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02. 2021 ජුලි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 ජුලි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 ජුලි**

පැය ගණන

| | | |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. එස්.පී.එම් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහයක) | 40 |
| 05. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. එන්.ජේ තිලකරත්න මයා | (රියදුරු) | 75 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. ඩී.එම් ගුණරත්න බංඩා මයා | (කා.කා සහයක) | 75 |
| 14. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 15. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 16. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා 2021 ජුලි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයන් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 ජුලි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03. බැකෝ ලෝඩරය සඳහා ගෙවූ මුදල් එම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉසුරු මාවත, කීරික්කුලම ලිපිනයේ පදිංචි පී.බී අමරසිරි යන අය විසින් 2021.03.12 වන දින 3254 දරණ ලදුපත් අංකයෙන් බැකෝ ලෝඩර සේවාව ලබා ගැනීම වෙනුවන් රු 3,300 ක් ගෙවීම් කර ඇතත් බැකෝ ලෝඩරය අළුත්වැඩියා කල යුතු තත්වයේ පැවති බැවින් එම කාර්යය ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් එම මුදල වන රු 3300 නැවත ඉල්ලීම් කර ඇති බව සඳහන් කර ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍ර සභා ගත කරන ලද අතර එම ගාස්තු නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල කාර්යය ඉටු නොකිරීම ප්‍රාදේශීය සභාවේ අඩුපාඩුවක් වන හෙයින් අදාල මුදල නැවත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල මුදල නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** **ගලි බවුසරය සඳහා ගෙවූ මුදල් හම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අභය මාවත, හරස් පටුමඟ, විජයපුර, අනුරාධපුර ලිපිනයේ එස්.ඒ.එස්.ඩබ් සුභසිංහ යන අය විසින් 2021.05.21 වන දින 3853 දරණ ලදුපත් අංකයෙන් ගලි සේවාව ලබා ගැනීම වෙනුවෙන් රු 6,596 ක් ගෙවීම් කර ඇතත් හදිසියේ දිවයින පුරා සංචාරක සීමා පැනවීම හේතුවෙන් එදින එම කාර්යය ඉටු කිරීමට නොහැකි වූ නිසා ඇය එම කාර්යය වෙනත් ආයතනයක් මගින් සිදු කර ගෙන ඇති බැවින් එම මුදල නැවත ගෙවීම් කරන ලෙසට කර ඇති ඉල්ලීම් හා ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍ර සභා ගත කරන ලද අතර එම ගාස්තු නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනිය අදාල මුදල නැවත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල මුදල නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** **ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම සඳහා අය කරනු ලැබූ මුදල් එම කාර්යය ඉටු කල නොහැකි වීම මත නැවත ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බුලංකුලම දිසා මාවත, අනුරාධපුර ලිපිනයේ ජයන්ත තෙල්ලම්බුර යන අය විසින් 2021.04.23 වන දින 3670 දරණ ලදුපත් අංකයෙන් ගොඩනැගිලි සැළසුම අනුමත කිරීම වෙනුවෙන් රු 6,050 ක් ගෙවීම් කර ඇතත් එම ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය වැඩි නිසා සභාවේ අනුමත කල නොහැකි බැවින් එම ගෙවන ලද මුදල් නැවත ගෙවීම් කරන ලෙසට කර ඇති ඉල්ලීම හා ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍ර සභා ගත කරන ලද අතර එම ගාස්තු නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල මුදල නැවත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල මුදල නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** **කොවිඩ් වසංගතය හමුවේ සහන ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම ප්‍රාදේශීය සභාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාව ලෙස සේවය කල ආර්.එම් මානෙල් පුෂ්පකාන්ති මිය දැනට මාස 2 කට ආසන්න කාලයක් දිවා සුරුකුම් මධ්‍යස්ථානය වසා දමා තැබීම නිසා ඉතාම දුෂ්කරතාවයක්ට මුහුණ පා සිටින බැවින් රු 5,000 ක මුදලක හෝ සහන දීමනාවක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇති බව ප්‍රකාශ කරමින් එම මුදල් ලබා දීම සුදුස බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ආර්.එම් මානෙල් පුෂ්පකුමාරි මියට රු 5,000 ක් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07. අතුරුවැල්ල ක්‍රීඩා පිටියේ අඩුපාඩු සම්පූර්ණ කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නාච්චාදූව, අතුරුවැල්ල , ජය ශක්ති ක්‍රීඩා සමිතිය විසින් ගරු මන්ත්‍රී සුනිල් සිරිසේන මැතිතුමා මගින්, අතුරුවැල්ල ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් ලබා දුන් 1,500,000 ප්‍රතිපාදනය මගින්, ක්‍රීඩා පිටියේ සම්පූර්ණයෙන් දැල් වැට ගසා ගේට්ටුව ඉදි කර ප්ලැස් ලයිට් 03 ක් සවි කර ඇති බවත්, දැනට එම භූමිය ක්‍රීඩා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කර ගැනීමට ලැබුණු මුදල් ප්‍රමාණවත් නොවූ බැවින්,

1. පිටිය මට්ටම් කර පිඩලි අල්ලා ගැනීම.
2. ප්ලැසර් සමඟ විදුලි පහන් කණුවක් සවිකර ගැනීම.
3. විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම

යන අඩුපාඩු සකස් කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කර ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ක්‍රීඩා අමාත්‍යාංශය හරහා මෙම ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු 1,500,000 ක් හිමි වූ අතර එමගින් ක්‍රීඩා පිටිය වටා දැල් වැට ඉදි කර ගේට්ටුව සවි කරන ලද අතර දැනට ක්‍රීඩා පිටිය පුරා බොරළු සහිත බැවින් ඒ මතට පස් දමා පිඩලි අල්ලා දෙන ලෙස ඉල්ලා ඇති හෙයින් ක්‍රීඩා අවශ්‍යතාවය සඳහා අදාල කාර්යය සිදු කල යුතු බව සඳහන් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල ක්‍රීඩා පිටිය සඳහා රු 1,500,000 වෙන් කර ඇතත්, එමගින් ක්‍රීඩා පිටියේ අවශ්‍යතාවය වන ක්‍රීඩා කල හැකි භූමිය සකස් කිරීම සිදු නොකිරීම අපරාධයක් බැවින් ඒ සම්බන්ධයෙන් කණගාටු වන බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල ක්‍රීඩා පිටිය සඳහා පස් ගෙනවිත් දැමීම සඳහා ඇස්තමේන්තුවට පිටින් සභාවේ වාහන යොදා ගැනීමේ හැකියාව පැවතියා වුවත්, ප්‍රතිපාදන හිමි වී ඇති ක්‍රීඩා පිටියක් සඳහා සභා යන්ත්‍ර සූත්‍ර ලබා දුන් බවට ගැටළුවක් මතු වන බැවින් සභා එකඟතාවය ලබා ගැනීමට කටයුතු කල බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා අදාල පිට්ටනිය ක්‍රීඩා පිටියක් නොව බොරළු වලක් ලෙසට පවතින බවට සඳහන් කල බැවින් , ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ බොරළු වලකට ද යන්න ගැටළුවක් මතු වන බව සඳහන් කරන ලදී.

තවද ක්‍රීඩා පිටියේ ප්‍රමුඛතාවය හිමි විය යුත්තේ, ක්‍රීඩා කිරීමේ හැකියාව ඇති කිරීම බැවින් මූලිකව සිදු කල යුතු වන්නේ ක්‍රීඩා පිටිය පස් පුරවා සකස් කිරීම බවත්, මෙහි ඇස්තමේන්තුව සකස් කිරීම සම්බන්ධව ගැටළුවක් මතු වන බව සඳහන් කරමින්, මේ වන විට සිදු කල යුතුව පවතින්නේ, මඩ නොවන පස් තුනී කර තණකොළ ඇට ඉසීම බැවින් එලෙස සිදු කිරීම සුදුස බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කළු ගලක් ක්‍රීඩා පිටියක් බවට පත් කල ප්‍රාදේශීය සභාවක් ලෙස මෙම ප්‍රාදේශීය සභාව හැඳින්විය හැකි බවත්, පොල් අඹයාගම ප්‍රදේශයේ ගලක් උඩ වටේට බැම්මක් බැඳ ඒ මත පස් පුරවා ක්‍රීඩා පිටියක් ලෙස සකස් කර දැල් පන්දු හා අත් පන්දු ක්‍රීඩා සිදු කල බවත්, එලෙස කළු ගලක් මත ක්‍රීඩා පිටියක් ඉදි කලානම් බොරළු වලක් ක්‍රීඩා පිටියක් ලෙස සකස් කිරීමේ හැකියාව පවතින බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කරත්, ක්‍රීඩා පිටියේ මූලික අවශ්‍යතාවය ඉටු වී නැතිනම් අපරාධයක් බවත්, ඉදිරිපත් වී ඇති යෝජනාව සඳහා මහ සභාවේ පොදු අනුමැතියක් හිමි වන්නේ නැතිනම් ඉටු කල නොහැකි බැවින් නිවැරදිව එම තීරණය ලබා ගත් යුතු බව ප්‍රකාශ කරමින් සභාවේ තාක්ෂණ නිළධාරී හා ඒ විෂය සම්න්ධයෙන් දැනුම ඇති පුද්ගලයෙකු ලවා ඇස්තමේන්තුවක් සකස් කර එය සභා ගත කර සභා අනුමැතිය ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මෙම ක්‍රීඩා පිටියට අයත් ගමේ ක්‍රීඩා සමාජය, පෞද්ගලිකව අත්පත් කර ගැනීමට උත්සහ කල පුද්ගලයෙකු සමඟ නඩු මාර්ගයට ගොස් අයිති කර ගත් ක්‍රීඩා පිටියක් බවත්, ඒ සඳහා ගරු එච්.බී සේමසිංහ මැතිතුමා උදව් කල බවත්, එවැනි ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරීම සඳහා ලැබුණු රුපියල් ලක්ෂ 15ක මුදලක් වියදම් කලත් ක්‍රිඩා පිටියේ මූලික අවශ්‍යතාවය අවසන් ප්‍රතිඵලය වී නැතිනම් ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම අවශ්‍ය නොවන බවත්, ජාතික මට්ටමේ අත්පන්දු ක්‍රීඩකයෙක් සභාව නියෝජනය කරන අවස්ථාවක ඒ සම්බන්ධයෙන් කරුණු විමසිය යුතු වන්නේ ඔහුගෙන් බවත්, මේ දිනවල දිවා රාත්‍රී ක්‍රීඩා කළ හැකි පරිදි ක්‍රීඩා පිටිය සකස් කළ යුතු සේම, ඒ සඳහා අවශ්‍ය ආලෝකය නොමැතිනම් නම් ඊට අවශ්‍ය ආලෝක පහන් ඇතුලත් කර හා ක්‍රීඩා පිටිය නිසි ලෙස සකස් කිරීම සිදු කළ යුතු නමුත් අප අදහස් කරන පරිදි එය පහසු කාර්යයක් නොවන බැවින් ඒ සඳහා සුදුසු ඇස්තමේන්තුවක් සකස් කළ යුතුම බවත් සඳහන් කර මේ කාර්යය සඳහා ඇස්තමේන්තුව සකස් කරන ලෙසට ප්‍රකාශ කරන ලදී.

තවද මෙම ක්‍රීඩා පිටියට අදාළව හිමි වූ රුපියල් ලක්ෂ 15ක මුදලින් කළ යුතු කාර්යය සම්බන්ධයෙන් ඉල්ලීම කළ පුද්ගලයා පිළිබඳ අදහස් දක්වනවාට වඩා ක්‍රියාව තුළින් සමාජයට වන යහපත හා නිරවුල් මනසක් සහිත පුද්ගලයකු බිහි කිරීම සඳහා වූ ක්‍රීඩාවේ අවශ්‍යතාවය වෙනුවෙන් ක්‍රීඩා පිටිය සුදුසු පරිදි සකස් කිරීමට දැනුම සහිත පුද්ගලයකු සමග තාක්ෂණ නිලධාරියාගේ පරීක්ෂාවෙන් ඇස්තමේන්තුවක් සකස් කර සහා අනුමැතිය ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මෙම ක්‍රීඩා පිටිය වෙනුවෙන් වැය කළ මුදල සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ගේ අවධානය යොමු කළ යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුව සකස් කර පළාත් පාලන ඉංජිනේරුවරයා පරික්ෂා කර පළාත් පාලන කොමසාරිස් හරහා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත යොමු කර එහි අනුමැතිය මත ක්‍රියාත්මක කළ බව සඳහන් කරමින් ක්‍රීඩාපිටියේ භූමිය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව සකස් කර මුදල් කමිටුවට ඉදිරිපත් කර මහා සභා අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී සිරිසෙන මැතිතුමා</u> ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අතුරුවැල්ල ක්‍රීඩා පිටියේ අඩුපාඩු සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් සකස් කර මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 ජුනි මස 10 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මුදල් කමිටු වාර්තාවේ බෝ වන රෝග නිවාරණය යටතේ පළමු ඡේදයේ නැවත බෝ නොවන රෝග නිවාරණය ලෙසට දක්වා තිබීම සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021මැයි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙවර ආදායම් වියදම් වාර්තා සකස් කරනු ලබන නිලධාරිනිය නිරෝධායනයට ලක් කිරීම හේතුවෙන් නියමිත ආකෘති පත්‍රය සකස් කිරීමට නොහැකි වූ බවත්, ඒ අනුව මැයි මස ලැබීම් ගෙවීම් සම්බන්ධ ව සටහනක් පමණක් ඉදිරිපත් කර ඇති බවත් ඊළඟ මහ සභාවේ දී අදාළ ලැබීම් ගෙවීම් වාර්ථා ලබා දීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

<u>ගරු මන්ත්‍රී ඩී.පී.බන්දුලසේන මැතිතුමා</u> නව ලේකම්වරයෙකු සභාවේ වැඩ බාර අරගෙන තිබෙන අවස්ථාවේ දී තමන් අද දින කරනු ලබන ප්‍රකාශය තුළ සභාව හැරවුම් ලක්ෂයකට ගෙන යාමට ලේකම්වරයාට හැකි වේවායි ප්‍රාර්ථනය කරමින් පසුගිය දිනවල මාධ්‍ය තුළ කීරික්කුලම කොම්පෝස්ට් අංගනය නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන බවට ගිය ප්‍රචාරයත් සමඟ ඉතාමත් මහන්සියෙන් පෞද්ගලික ධනය පවා වියදම් කරමින් කාලය ශ්‍රමය වැය කරමින් ප්‍රාදේශීය සභාවට එම ව්‍යාපෘතිය ගෙන ආ තමන් පිළිබඳව දැඩි අනුකම්පාවක් ජනිත වන බවත්, එම ව්‍යාපෘතිය අත්පත් කර ගැනීමට උත්සාහ කළ අවස්ථාවේදී පරිසර අමාත්‍යාංශයේ සිටි පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා එම ව්‍යාපෘතිය මෙම ප්‍රාදේශීය සභාවට හිමිකර දීමට ගත් තීරණයට අදටත් ස්තුතිවන්ත වන බවත්, දැනටත් පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් මුණගැසුන විට කොම්පෝස්ට් ව්‍යාපෘතිය හොඳින් ක්‍රියාත්මක වන්නේද යන්න විමසන බවත්, අපේ භූමියේ පිහිටි අපේ සම්පතක් වන කීරික්කුලම කොම්පෝස්ට් ව්‍යාපෘතිය නගර සභාවට පවරා දීමට හේතු වූයේ ප්‍රාදේශීය සභාව සතු සම්පත් ප්‍රමාණවත් නොවීම මත වුවත් 2006 තමන් මෙම ප්‍රාදේශීය සභාවට ගරු සභාපති ලෙස පත් වී පැමිණීමේ දී මෙම ප්‍රාදේශීය සභාව විශාල මුදල් අර්බුදයක සිටි බවත් ඒ අනුව මෙම ව්‍යාපෘතිය දැඩි වෙහෙසක් දරා සභා ආදායම් උත්පාදන ක්‍රියාවක් ලෙස නගර සභාවේ කුණු ලබා ගනිමින් කොම්පෝස්ට් කර කොම්පෝස්ට් ආදායමක් ලබාගැනීමට මෙන්ම, පෞඩ ඉතිහාසයක් ඇති අනුරාධපුර පූරවරයට පැමිණෙන ජනතාව කසල වලින් තොර නගරයක් වෙත ගෙන්වා ගැනීමේ අරමුණින් බවත්, එවකට නාගරික කොමසාරිස් ලෙස සිටි සරත් විජේසිරි මැතිතුමා මෙම අදහස තමන් වෙත ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා රුපියල් ලක්ෂ 6 ක් ලබාදීමට එකඟ වූ බවත්, පසුගිය කාලය පුරා මසකට රුපියල් ලක්ෂ 3 ක ආදායමක් හිමිකරගත් සේම 20% ක කොම්පෝස්ට් පොහොරද ලබාගත් බවත්, මේ වන විට එම සියල්ල අහිමි කර ගැනීම මත සභා ආදායම් අහිමි කරගත්තා යන චෝදනාවට සභාව ලක්වන බවත් සඳහන් කරමින් මේ සම්බන්ධයෙන් පවතින වේදනාත්මක හැඟීම මත තමන් මෙම අදහස් දැක්වීම් සිදු කරන බවත් සඳහන් කරන ලදී.

තවද මේ සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමක් නොමැති බවත්, මේ සඳහා අනුරාධපුර මහ නගර සභාවේ කිසිදු සම්බන්ධයක් නොමැති බවත් ප්‍රධාන ලේකම්, පළාත් පාලන කොමසාරිස්, නැනුප ප්‍රාදේශීය සභා සභාපති යන පුද්ගලයින් තුන්දෙනා සහිත කමිටුවක් මාසිකව රැස්වීමටත් මෙම කමිටුව මගින් මසකට රුපියල් ලක්ෂ තුනක් ලබා දීමටත් පොහොර නිෂ්පාදනයෙන් 20% සභාවට ලබා දීමටත් තීරණය කර තිබූ බවත්, එහි ප්‍රධානියා

ප්‍රධාන ලේකම් ලෙස සිටි බවත් අදාළ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කිරීම සඳහා තමන් ඕනෑම අවස්ථාවක යාමට සූදානම් බවත් සඳහන් කරමින් අදහස් දැක්වීම් අවසන් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය ලබා ගැනීමට අදාළ ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමේ දී සභාවේ සහයෝගය දැක්වූ නිලධාරීන් කිසිසේත්ම අමතක කළ නොහැකි බවත් ව්‍යාපෘති වාර්තාව සකස් කර භූමිය පරික්ෂා කර බලා කොම්පෝස්ට් අංගනයේ භූමිය තෝරා ගත් සේම නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාව ලෙසට ඇස් ඇරෙන්න ලංකාවේ පළමු කසල පොල තමන් ගරු සභාපති වී මාස කිහිපයක් තුල සිදුකල බවත්, එසේ කළ අප නගර සභාවට පැමිණි ව්‍යාපෘතියක් කරන්න තැනක් නොමැතිව මෙම ප්‍රාදේශීය සභාව භාරගත් බව සඳහන් කරනවා නම් ඉතාම කණගාටු වන බවත් ගරු සභාවක් එක්වී මහන්සියෙන් ලබාගත් ව්‍යාපෘතියක් අද වෙන කිසිවෙකු අයිතිවාසිකමක් ප්‍රකාශ කරමින් ලැබිය යුතු රුපියල් ලක්ෂ 3ක් ලබා නොදෙන්නේ නම් ඒසම්බන්ධයෙන් අදාළ පියවර ගත යුතු බවත්, ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව හා වෙනත් නීති සැලකිල්ලට ගැනීමේදී අපට අයත් භූමියක වෙනත් පාර්ශ්වයක් සඳහා භාවිතා කිරීමට අවස්ථාව ලබා දීම සිදු කළ යුතු නැති බව සඳහන් කරන ලදී.

තවද තෝරා ඉවත් කරන ලද එනම් තවදුරටත් නොදිරන කසළ අවසන් බැහැරලීම සඳහා යොමු කළ යුතු බවත් දිරන කසල සියල්ල කොම්පෝස්ට් කළ හැකි බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද සභා සේවකයන් එකතු කරනු ලබන නොදිරන කසල මුදල් බවට පත් කර ඒ පුද්ගලයින් අතර බෙදා ගත් බවත් ඔවුන් අදාළ කාර්යය ඉතා කැමැත්තෙන් සිදුකළ බවත් ඔවුන්ට අවශ්‍ය සබන් ඇතුළු සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ ලබා දෙමින් අවශ්‍ය පහසුකම් සැපයූ නමුත් නගර සභාව විසින් කිසිදු සුබසාධනයක් නොදීම නිසාම සේවකයන්ගේ ක්‍රියාකාරීත්වයෙන් තොරවී කුණු කන්ද ගම තුළ ඇති කර අපිරිසිදු ජලය වැව් ජලය සමග මිශ්‍ර වී කුණු වල ගඳ ගමට ගොස් අප්‍රසන්න වූ බවත් නිවැරදි ක්‍රමවේදයට කසල කොම්පෝස්ට් කළා නම් ගඳ නොගසන බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී ඩී පී බන්දුලසේන මැතිතුමා සඳහන් කළ කරුණු සියල්ල නිවැරදි බවත්, ඒ අනුව මසකට රුපියල් ලක්ෂ 03 ක්ද පොහොර නිෂ්පාදනයෙන් 20% ද ලබා දීම සඳහා අනුරාධපුර මහ නගර සභාව සමග එකඟතාවයකට ගිය බවත් මේ වන විට ඉතිහාසය පුරා තුන් හතර වතාවක් පමණක් පොහොර 20% ලැබී තිබෙන බවත්, රුපියල් ලක්ෂ තුන දිගට ම ලැබී තිබෙන බවත්, ව්‍යාපෘතියට අදාළ සේවකයෝ බඳවා ගැනීම ප්‍රාදේශීය සභාව සිදු කළා වුවත් සේවකයන් ස්ථිර කර අනුමත කාර්ය මණ්ඩලය තුලට ඇතුලත් කර ගැනීම මහ නගර සභාව විසින් සිදුකර ඇති බවත්, ඊයේ දිනයේදී සභාවේ ලේකම්තුමා සමග ප්‍රධාන ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්තුමා හා පළාත් පාලන කොමසාරිස්තුමා සමග කරනු ලැබූ සාකච්ඡාවේදී නගරාධිපතිතුමා විසින් මෙම ව්‍යාපෘතිය ගරු හිටපු නගරාධිපති කල්දේරා මැතිතුමාගේ කාලයේදී පැමිණි පසු එවකට නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඩී.පී. බන්දුලසේන මැතිතුමා මෙම ව්‍යාපෘති සිදු කිරීමේ හැකියාව පවතින බවට ප්‍රකාශ කරන මෙන් ව්‍යාපෘති ලබාගත් බවත්, ඒ අනුව පිළිසරු ව්‍යාපෘතිය මැදිහත් වී අදාළ ගොඩනැඟිලි ඉදිකර ප්‍රාදේශීය සභාවට භාර දී ක්‍රියාත්මක කිරීමට ඉඩ කඩ සකස් කර දුන් බවත්, පසුව නගර සභාවේ කුණු සම්බන්ධයෙන් පවතින ගැටලුවලට විසඳුමක් ලෙස පිළිසරු ව්‍යාපෘතිය, ප්‍රධාන ලේකම්, පළාත් පාලන කොමසාරිස්, මහ නගර සභාවේ නගරාධිපති තුමා හා ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා එක්වී ප්‍රාදේශීය සභාවේ පවතින අපහසුතා හඳුනාගෙන මෙම ව්‍යාපෘතිය මහ නගර සභාවට පවරා දීමටත් ඒ අනුව ප්‍රාදේශීය සභාවට මසකට රුපියල් ලක්ෂ තුනක් ද 20% ක පොහොර ද ලබාදෙන බවට එකඟතා ගිවිසුමකට ගිය බවත්, ඒ අනුව දිගින් දිගටම රුපියල් ලක්ෂ තුනක මුදල ප්‍රාදේශීය සභාවට හිමි වූ අතර පසුව කසළ අංගනය තුළ සිදුවූ අවිදිමත් කසල බැහැර කිරීම නිසා ගම තුළ හටගත් විරෝධතාවය මත කසල බැහැර කිරීම නතර කළ බවත්, ඒ අනුව මහ නගර සභාව විශාල වියදමක් දරා එකතු වන කසළ දඹුල්ල වෙත රැගෙන යන අතර තුර නගර සභාව කසළ අංගනය අවශ්‍ය බවටත්, ගම්වාසීන් නගර සභාවට විරුද්ධවත් නඩු පැවරූ අතර අංගනයේ පවතින අවිධිමත් බව විධිමත් කිරීම සඳහා කොන්දේසි කිහිපයක් සඳහන් කර උසාවි තීන්දුවක් නගර සභාවට ලබා දුන් බවත්, ඒ අනුව රුපියල් මිලියන 20 ක් වැයකර

අදාල අඩුපාඩු සකස් කර පසුවත් ගම්වැසියන් විරුද්ධ වූ අතර නමුත් උසාවි තීන්දුවක් මත නැවත අවිධිමත් වීමට අදාල කාර්යන් ඉටු නොකරන එකඟතාවය මත කුණු බැහැර කිරීමට නගර සභාවට අවස්ථාව ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

තවද අදාල විධිමත් වීමෙන් අනතුරුව තමන් විසින් මීට ඉහතදී නොලැබී ගිය රුපියල් ලක්ෂ තුනක මුදල හා 20% ක පොහොර කොටස් ලබා දෙන ලෙසට සභා තීරණයක්ද සමග ඉල්ලීම් කළත් ගෙවීම් සිදු නොකළ බැවින් ඒ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත පැමිණිලි කිරීමෙන් අනතුරුව ආණ්ඩුකාරතුමා පළාත් පාලන කොමසාරිස්තුමා, ප්‍රධාන ලේකම්තුමා හා ගරු නගරාධිපතිතුමා, නාගරික කොමසාරිස්තුමා හා තමන් ඇතුළුව ලේකම්තුමා සමඟ සාකච්ඡාවක් ඊයේ දිනයේ දී පැවැත්වූ බවත් නමුත් නගරයේ කසල කළමනාකරණය කළ යුතු බැවින් කොම්පෝස්ට් අංගනය පවත්වාගෙන යන නගර සභාවේ පවතින මුදල් අර්බුදය හේතුකරගෙන රුපියල් ලක්ෂ තුනක මුදල ගෙවීම සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය වීමෙන් අනතුරුව ඉදිරියේදී එකඟතාවයකට එන බවට සඳහන් කළ බව ප්‍රකාශ කරන ලදී.

තවද කීරික්කුලම කසළ අංගනය සම්බන්ධයෙන් වන ගැටළුව සඳහා සභාව තුළින් කමිටුවක් නම් කරන ලෙසත් එය නම් කරනු ලබන කමිටුව අදාළ ප්‍රධානින් සමඟ සාකච්ඡා කිරීම සිදු කරනවා විනා සභාව තුල අදහස් දැක්වීම ඵලදායී නොවන බවත් වර්තමාන ගැටළුවට විසඳුම් සෙවීම පමණක් සිදුකළ යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත මැතිතුමා</u> කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දිගින් දිගටම ගරු සභාවේදී සාකච්ඡා කර නමුත් ව්‍යාපෘති සභාවට අත්පත් කර ගැනීමට මෙතෙක් නොහැකි වූ බවත්, ඒ සඳහා ප්‍රායෝගික ගැටළු මෙන්ම දේශපාලන මැදිහත්වීම ද බලපාන්නට ඇතැයි තමන් විශ්වාස කරන බවත්, ඒ අනුව ගරු සභාපතිතුමා යෝජනා කළ පරිදි කමිටුවක් රැස් කිරීම වඩාත් සුදුසු ක්‍රියාවක් බව සඳහන් කරමින් කමිටුව සඳහා ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රී ඩී.පී.බන්දුලසේන මැතිතුමා ගරු මන්ත්‍රී ආර්.එම්. කුමාරසිංහ මැතිතුමා හා ගරු උප සභාපති සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

තව වර්තමාන රජයේ විසින් කාබනික වගාව කෙරේ අවධානය යොමු කිරීම රජය පත්වූ පසුව ගත් හොඳම තීන්දුව යයි අදහස් කරන මුත් අතිගරු ජනාධිපති ජනාධිපතිතුමාගේ සෞභාග්‍යය දැක්ම යටතේ දැක්වූ පරිදි මෙය පියවරෙන් පියවර සිදුකලා නම් සුදුසු බවත්, එක්වරම මෙම ක්‍රියාමාර්ගයට යාම තුළ යම් යම් ගැටලු ඇති වුණු බවත්, අදාල ප්‍රදේශයේ මේ වන විට ගොවීන් සැලකිය යුතු ප්‍රමාණයක් ගොවිතැන අතහැර ඇති බව එළඹෙන මාස් කන්නය තුළ අදාළ අත්හැරීම් සම්බන්ධයෙන් අපට දැනේවී යන්නත් සිදු කළ යුතු ව පැවතියේ කාබනික ගොවිතැනට ක්‍රමානුකූලව පිවිසීම බවත් මෙහිදී ගොවියා වෙනුවෙන් සාධාරණයක් ඉටු කළ යුතු බවත්, රසායනික පොහොර අවශ්‍ය නැති බවට අදහස් කළා වුවත් ඊට අදාළ ක්‍රමවත් වැඩ පිළිවෙලක් රජය විසින් සකස් කර නොමැති බවත්, කාබනික පොහොර සම්බන්ධයෙන් පත් කර ඇති පාර්ලිමේන්තු මන්ත්‍රී ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා පසුගිය සතියේ අනුරාධපුර දිස්ත්‍රික්කයට පැමිණි අවස්ථාවේ දී ගොවීන් සමඟ සාකච්ඡා කර ගොවිබිම් පරික්ෂා කළ බවත් අනතුරුව කල සාකච්ඡාවේදී පවතින ගැටලු සඳහන් කළ බවත්, එහිදී තවමත් මේ සඳහා මුදල් වෙන් කර නොමැති බවත්, ඒ ඒ අමාත්‍යාංශ වල අමාත්‍යවරුන් අතර එකඟතාවයක් හා මීට අදාළ තාක්ෂණික ක්‍රමවේදය ඉදිරිපත් කර නොමැති බවත්, එසේ තිබියදී රසායනික පොහොර නතර කරන බවට තීරණය කර ඇති බවත් රසායනික පොහොර ආනයනය කිරීමේදී එහි පවතින සංඝටක පිළිබඳ පරික්ෂා කරන පරික්ෂණාගාරයක් ස්ථාපිත කර තිබුනා වුවත් මෙතෙක් කාබනි පොහොර සඳහා පරීක්ෂණාලගාරයක් ස්ථාපනය කර නොමැති බවත් එවැනි තත්ත්වයක් තුළ මෙය මෙම පොළොවේ ක්‍රියාත්මක කිරීම් ගැටලුකාරී වන බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී. බන්දුලසේන මැතිතුමා පෙරවරු 11.15 ට මහා සභා ගර්භයෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිණිය පෙ.ව 11.17 ට මහා සභා ගර්භයෙන් පිටව යන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ලංකාවට ගෙන්වනු ලබන රසායනික පොහොරවල පවතින රසායනික සංඝටක සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත් දැනට ඉරානය සමඟ පොහොර ගෙන්වීම සඳහා ගිවිසුම් ගත වී සිටියත් මේ වන විට ඊට පරිබාහිරව වෙනත් රටවල් වලින් පොහොර මිලදී ගැනීම සිදු කරනු ලබන බවත් එකවර අවශ්‍ය පොහොර ප්‍රමාණය සපයා ගන්නේ කෙසේද යන්න කාබනික පොහොර සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටළු වන බවත්, ඒ සඳහා නිවැරදි තාක්ෂණයක් භාවිතා කළ යුතු වන සේම මේ වන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට, කාබනික කෘෂිකර්ම අමාත්‍යාංශයට, කෘෂිකර්ම ඇමතිවරුන්ටත් ජෛව විද්‍යාත්මක කෘෂි කර්මාන්තයට යා යුතු බවට යෝජනා ඉදිරිපත් කර ඇති බවත්, එය ශුද්‍ර ජීවී තාක්ෂණය ලෙස නම් කර ඇති සේම මේ වන අමාත්‍යවරු ඒ සඳහා අවධානය යොමු කර ඇති නමුත් එම ක්‍රමවේදය සඳහාද මෙලෙස ඉතා කෙටි කාලයකින් යා නොහැකි බවත් ඒ අනුව පූර්ව සූදානමක් නොමැති ක්‍රියාමාර්ගයක් විසින් හොඳම දෙයක් අර්බුදයට ලක් කර ඇති බව සඳහන් කරන ලදී

තවද මෙම වැඩපිළිවෙල අතිගරු ජනාධිපතිතුමාගේ අදහසක් වන බැවින් මෙම සංකල්පය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භූමියේ ස්ථාපිත කිරීම සඳහා සභාවේ ගරු සභික වරුන් ගෙන ඇති උත්සාහය කෙබඳුද යන්නත්, ඒ සඳහා ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් අවධානය යොමු කළ යුතු ම බවත් ජෛව විද්‍යාත්මක කෘෂිකර්මය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන මැදිහත් වනවානම් එයට අවශ්‍ය තාක්ෂණය ලබාදීමට සූදානම් බවට ප්‍රකාශ කර ඇති බවත් ඒවායෙහි යම් යම් ගැටළු පවතින නමුත් මෙම ගැටළු වලින් තොරව ඉදිරියට පවත්වාගෙන යා යුතු නම් ඒ සඳහා ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර සභාවක් ලෙසට අප ගොවියා මුහුණ දෙන ගැටලුව තාවකාලික විසඳුමක් හෝ ලබාදිය යුතු බවත් එය තිරසාර විසඳුමක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට විසඳුමක් සභාවක් ලෙස මැදිහත් වීමක් වෙමු යන්නත් ඒ සඳහා ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් වඩා සැලකිලිමත් විය යුතු බව සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී එම් ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා කසල කළමනාකරණය වෙනුවෙන් සකස් කර ඇති යන්ත්‍රය මඟින් ඉතා කෙටි කාලයකින් විශාල අතු හා ගස් කොටස් කුඩා කැබලි වලට වෙන් කිරීමේ හැකියාව පවතින බවත්, එවැනි යන්ත්‍රයක් මෙම සභාවේ ගරු මන්ත්‍රීවරයෙකු සකස් කිරීම සම්බන්ධව අප ආඩම්බර විය යුතු වනවා සේ ම එතුමා වෙත ස්තූතිය ප්‍රකාශ කළ යුතු බවත්, ලංකාවේ කාබනික කෘෂිකර්මාන්තය දියුණු කරනවා නම් එවැනි දක්ෂ පිරිස් හඳුනාගෙන ඔවුන් දිරි ගැන්වීම හා යන්ත්‍ර සූත්‍ර සකස් කිරීමේ හැකියාව පවතින බවත්, එවැනි පුද්ගලයින් දේශපාලන හස්තයට හසු වී ලකුණු දමා ගන්නට යන අවස්ථාවල දී ඔවුන්ට අසාධාරණයක් සිදුවන බවත් එම ක්‍රියාමාර්ග නතර කර එවැනි දක්ෂ පිරිස්වලින් සහයෝගය ලබාගත යුතු බව සඳහන් කරන ලදී

ඒ අනුව ගොවියා බේරා ගැනීමට ආණ්ඩුව අවධානය යොමු කළ යුතු වනවා සේම ගරු සභාවක් ලෙස අප ද මේ සඳහා මැදිහත් වීම සිදු කළ යුතු බවත් සඳහන් කරමින් අදහස් දැක්වීම් අවසන් කරන ලද අතර පෙ.ව 11.45 සභා ගර්භයෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා පෙ.ව 11.46 සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම්.කුමාරසිංහ මැතිතුමා</u> මේ වසර තුළ ප්‍රදානයක් ලෙස පළාත් පාලන ආයතන මගින් surgical mask පන්දහසක් ලැබී ඇති බැවින් අදාළ මාස්ක් ලබාදීම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙසත් හිටපු ගරු සභාපතිතුමා කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී ගරු සභාපතිතුමා එහි භූමියේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුව නොපවතින බවට ප්‍රකාශයක් සිදුකළ බවත් අදාළ පිළිසරු ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ මෙම බල ප්‍රදේශය තුළ ජනිත වන කුණු වලට විසඳුම් සෙවීමට වුවත්, එම කාලය තුළදී අනුරාධපුර මහ නගර සභාවේ කුණු මෙම කොම්පෝස්ට් අංගනය තුළට ගෙන ඒම සම්බන්ධව තමන් විශාල විරෝධතාවක් දැක්වූ බවත් වර්තමානය තුළ දී සිදු කළ යුතු වන්නේ මෙම ව්‍යාපෘතිය

ක්‍රියාත්මක වීම තුළ මෙම බල ප්‍රදේශයේ මාර්ග විනාශයට පත් වන්නේ නම්, බල ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයට පත් වන වා නම් ඒ සම්බන්ධයෙන් අප සභාවක් ලෙස අවධානයට ලක් කළ යුතු බවත් සාමාන්‍යයෙන් රජයේ ඉඩමක වසර 5 ක් අඛණ්ඩව එක් පුද්ගලයකු භාවිතා කරන්නේ නම් එම ඉඩමේ අයිතිය ඒ පුද්ගලයන්ට හිමිවන බවට නෛතික තත්ත්වයක් පවතින බැවින් කොම්පෝස්ට් අංගනයේ භූමිය ප්‍රාදේශීය සභාව සතු විය යුතු බවට නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි බවත් ඒ සඳහා වූ සාක්ෂි ඕනෑතරම් පවතින බවත් සඳහන් කරන ලදී

තවද වර්තමාන රජය බලා බලාපොරොත්තු වෙන කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියේ දී කීරික්කුලම කසළ අංගනය මරමස්ථානයක් බවට පත්වන බවත්, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිළිසරු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන එකම ව්‍යාපෘතිය මෙය වන බවත්, මේ වන විට යන්තම් කැබලි වූ පොහොර ට්‍රැක්ටරයක් සඳහා නගර සභාව රුපියල් තුන්දාහක් අය කරන බැවින් මෙය බරපතළ කාරණයක් වන බවත් මේ සම්බන්ධයෙන් සාධනීය මැදිහත්වීමක් සිදුකර සභාවේ ආදායම් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලද අතර නගර සභාව විසින් රුපියල් ලක්ෂ තුනක් ලබා නොදෙන්නේ අප ජනතාව පෙළ ගස්වා සුදුසු පියවර ගත යුතු බව සඳහන් කරන ලදී.

තවද ලෝකයේ කිසිදු රටක් රසායනික පොහොර සම්පූර්ණයෙන් නතර කර නොමැති බවත්, කාබනික පොහොර නිෂ්පාදනය කළ යුත්තේ රට අභ්‍යන්තරයෙන් වන බවත්, පිටරටින් ගෙන්වනු ලබන පොහොර හරහා ආක්‍රමණශීලී වල් පැලෑට, ක්ෂුද්‍ර ජීවීන් හා වෙනත් රෝග පැමිණ සම්පූර්ණයෙන් බෝග විනාශ වීමේ අවධානමක් පවතින බවත්, රට තුළ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් නොවන බැවින් ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය තුල පවතින විෂ රසායන ද්‍රව්‍යවලට සිදුවන්නේ කුමක් ද යන්නත් දේශීය ගොවියා නිෂ්පාදනය කරනු ලබන බෝග සඳහා මෙවැනි ක්‍රම අනුගමනය කරමින් සිදු කරනු ලබන ක්‍රියාව තුළ ගැටලු ගණනාවක් පවතින බවත් නිසි කළමනාකරණයක් සහිතව මෙම ක්‍රියාමාර්ගයට යා යුතු බවත් ප්‍රකාශ කරමින් නොමිලේ ලබාදෙන පොහොර බල ප්‍රදේශයේ ජනතාවට ලබාදීමට අදාළ සාධනීය මැදිහත්වීම සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවදුරටත් අදහස් දැක් වූ ගරු මන්ත්‍රී ආර්.එම්. කුමාරසිංහ මැතිතුමා කඩ කාමර ටෙන්ඩර් කරනු ලැබූ ටෙන්ඩර් මණ්ඩල වාර්තාව සභාගත කිරීමට කටයුතු කරන ලෙසත් විගනණ වාර්තාව ද ඊට අදාළ පිළිතුරු හා මතයද සභාගත කරන ලෙසත් ඉල්ලා සිටින ලද අතර covid වසංගත තත්වය හමුවේ දැනට පළාත් පාලන ආයතනයක් ලෙසට කෝවිඩ් මර්දන කමිටුව සමග පවතින සම්බන්ධතාවය කෙබඳුද යන්න විමසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා පෙ.ව 11.50 සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> බල ප්‍රදේශයේ මාර්ග බොහොමයක් ගමන් කිරීමට නොහැකි තත්ත්වයක පවතින බැවින් ඍජු මිනිස් ශ්‍රමය හෝ භාවිතා කරමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලද අතර අනුරාධපුර දිස්ත්‍රික්කය ආසන්නයේ පවතින පිළිසරු ව්‍යාපෘතිය අප සතුව පවතින බැවින් අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය මත ක්‍රියාත්මක කරන කාබනික ගොවිතැන සඳහා සභාවක් ලෙස වගකීම් බාර අරගෙන නෛතික තත්ත්වය ප්‍රාදේශීය සභාව සතුව කෙසේ පැවතියත් වසර ගණනාවක් පුරා අඛණ්ඩව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භූමියේ පවත්වාගෙන ගියේ කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් පරිසර නීති රීති සලකා බලා හා ගරු ජනාධිපතිතුමා සඳහන් කළ පරිදි සෑම පළාත් පාලන ආයතනයක් කාබනික පොහොර නිෂ්පාදන කාර්යය ආරම්භ කළ යුතු බවට ප්‍රකාශ කර ඇති බැවින් ඉදිරිපත් කමිටුව සමග සාකච්ඡා කර කඩිනම් පියවර ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලද අතර කමිටුව සඳහා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ද ඇතුලත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද ගරු මන්ත්‍රී ආර්.එම්.කුමාරසිංහ මැතිතුමා කාබනික ගොවිතැන යන්න විහිළුවක් බවට ප්‍රකාශ කලත් එලෙස සෘණාත්මක තත්ත්වයක සිටීම කණගාටුදායක බවත් කාබනික පොහොර දැනට වසර 20 ක කාලයක සිට ලංකාවට ආනයනය කරන බවත් කාබනික ගොවිතැන ඔස්සේ ගොවිතැන් කටයුතු කරනු ලබන පුද්ගලයින් විශාල පිරිසක් ලංකාව තුළ සිටින බවත්, ඒ සඳහා වන ව්‍යාපාරිකයන් පිරිසක් ද සිටින නමුත් මේ සම්බන්ධයෙන් කිසිවකු දැනුවත් නොමැති බවත් සඳහන් කරමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ දී රට තුළ යහපත් තීන්දු තීරණ ගත්තා වුවත් ජනතාවගේ පවතින ආකල්පමය දුර්වලතාවයන් නිසා එවැනි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූ බවත් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විශාල වෙහෙසක් දරා රට තුළ කාබනික ගොවිතැන ඇති කිරීමට ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් මහජන නියෝජිතයකු ලෙස ඉතාමත් සතුටු වන බවත් ඉදිරියේ දී පත් කරගනු ලබන කමිටුව මඟින් හෝ අදාළ ව්‍යාපෘතිය මෙම සභාවට පවරා ගැනීමට කටයුතු කරන්නේ නම් වඩාත් සුදුසු බවත් සඳහන් කරන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු උප සභාපති එම්. සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු මන්ත්‍රී පී.ටී.සිරිසේන මැතිතුමාගේ කොට්ඨාශයේ ඉදිකළ ක්‍රීඩාපිටිය සම්බන්ධයෙන් තමන් අදහස් දැක්වූයේ ප්‍රතිපාදන හිමි වී තිබියදී අවශ්‍ය කාරණය වෙනුවෙන් ප්‍රමුඛතාවය හිමි නොවීම සම්බන්ධයෙන් වන බවත් මේ සඳහා සභාව මැදිහත් වී ලබා දෙන සහයෝගයට තමන් පූර්ණ මැදිහත්වීම සිදු කරනු ලබන බවත් තමන් ජාතික මට්ටමේ අත්පන්දු ක්‍රීඩකයකු ලෙස මෙම ක්‍රීඩාංගනය ඉදිකළ බවට දැනුවත් බැවින් ක්‍රීඩා පිටියේ අවශ්‍යතාවය අනුව ඉතුරු අලුත්වැඩියාවන් සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා</u> කසල එක්රැස් කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගී ඇති බවත් මේ වන විට මාස තුනක් සඳහා මුදල් ගෙවීම කළත් පාලාඩිකුලම මාර්ගයේ කුණු එකලස් කිරීම සඳහා මෙතෙක් පැමිණ නැති බවත් සභාවට මේ වන විට ලබාගෙන ඇති තණකොළ කපන යන්ත්‍රය මගින් ක්‍රීඩාපිටි පළමුවර ශුද්ද කරන බවට සඳහන් කළත් මේ වන විට ශුද්ධ කර ඇති ක්‍රීඩා පිටි මොනවාද යන්නත් ගරු මන්ත්‍රීවරයෙකු ලෙස තමන් වෙත මෙතෙක් හැඳුනුම්පත ලබා දීම සිදු කර නැති බවත් සභාවේ නිලධාරි මණ්ඩලයේ දෛනික කාර්යන් මෙහෙම තැනක සිටිය දී ජනතාවගේ රාජකාරි සිදු කරනු ලබන්නේ කෙසේද යන්නත් විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී.කුමාරදාස මැතිතුමා</u> මෙම කාර්යය සභාව තුළ ඉටු කරනු ලබන කාර්යයක් නොවන බවත් ගරු මන්ත්‍රීතුමාගේ තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමුකල පසු ඔවුන් ග්‍රැෆික් ආර්කේඩ් ආයතනය වෙත යවා ඉටු කරන කාර්යයක් බවත් මේ දිනවල එම ආයතනය වසා දමා ඇති බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා , ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය, ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා ප.ව 12.01 මහ සභාවෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය ප.ව 12.03 සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී. සිරිසේන මැතිතුමා</u> ජනාධිපති තුමාගේ සංකල්පය තුළ හරිත රාජ්‍යයක් ඇති කිරීම වෙනුවෙන් දැනට වසරකට ආසන්න කාලයක සිට කාබනික ගොවිතැන් ආරම්භ කරන ලෙසට දැනුවත් කිරීම් සිදු කළ බවත්, මේ වන විට සෑම ගොවියෙක් මගින් සිය අවශ්‍යතාවය වෙනුවෙන් ආවශ්‍ය පොහොර නිෂ්පාදනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් පවා දියත් කර තිබෙන බවත්, නාච්චාදූව යල කන්නයේ සෑම ගොවියෙක් වෙනුවෙන්ම කාබනික පොහොර ලබා දීමට අදාල ලැයිස්තු ලබා ගෙන තිබෙන බවත්, සමෘද්ධි සහනාධාරය හිමි පුද්ගලයින් සඳහා නිශ්පාදනයන් කිරීමට අදාල ප්‍රතිපාදන වෙන් කිරීමටද කටයුතු කරගෙන යන බවත්, සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා නාච්චාදූව ජනපදය තුල ගොවීන් ගොවිතැන් කටයුතු අත්හැරී ඇති බවට සඳහන් කලත් , තමන් එසේ කිසිදු ගැටළුවක් නොමැති බවට තහවුරු කරන බවත්, නාච්චාදූව ජනපදය සඳහා අවශය සියළු පොහොර ප්‍රමාණයන් ලැබී තිබෙන බවත්, සඳහන් කරන ලදී.

මේ වන විට එළවළු ගොවීන් සඳහා එක් පොහොර මිටියක් රු 1,500 ක මුදලක් අය කර ගනිමින් ලබා දෙන බවත්, යල් කන්නය සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය පිටරටින් ගෙන්වා තිබුනත්, යම් යම් පුද්ගලික ආයතන මැදිහත් වී පොහොර තොග සැඟවීම මත පොහොර හිඟයක් පෙන්නුම් කරන බැවින් එලෙස එළවළු ගොවීන් සඳහා ගාස්තු අයකර ගැනීමට සිදු වී ඇති බව සඳහන් කරන ලදී. තවද මේ වන විටත් ගොවීන් කාබනික පොහොර නිෂ්පාදනය කරනවා මෙන්ම භාවිතය සඳහා අවධානය යොමු කර ඇති බවත්, මේ වන විට තම කොට්ඨාශයේ සෑම නිවසකම කාබනික පොහොර වලක් සකස් කර ගෙන ඇති අතර යම් යම් ගැටළු පැවතියා වුවත්, අප කාබනික ගොවිතැන ආරම්භ කල යුතු බවත්, රජයක් ලෙස මෙම අභියෝගයහට මුහුණ දෙන්නේ ඡන්දය හෝ වෙනත් ප්‍රතිලාබයක් සඳහා නොවන බැවින් අප සියළු දෙනාම එකතු වී මේ සඳහා සහයෝගය ලබා දිය යුතු බවත්, මෙම සංකල්පය ක්‍රියාත්මක වීම තුල අනාගතයේදී ලෙඩ රෝග වලින් තොර හොඳ සෞඛ්‍ය සම්පන්න රටක් බිහි වන බවට කිසිදු සැකයක් නොමැති බවත්, සඳහන් කරන ලදී.තවද ඇතැම් දේශපාලන කණ්ඩායම් මෙම සංකල්පය අසාර්ථක බවට ගොවීන් වෙත පුහු මත පල කරන බැවින් එවැනි ජාතික අපරාධයක් සිදු නොකරන ලෙස ඉල්ලා සිටින ලද අතර කුමන බාධක පැමිණුනත් මෙම අසාර්ථක නොවන බව ප්‍රකාශ කරන ලදී.

තවද අතුරුවැල්ල ක්‍රීඩා පිටිය සම්බන්ධයෙන් ඇතුම් ගරු මන්ත්‍රිවරුන් වපසරිය හෝ නොදැන අදහස් දැක්වීම සම්බන්ධව කණගාටු වන බවත්, මේ වන විට එම ක්‍රිඩා පිටිය ඉතාමත් හොඳ තත්වයේ පවතින නමුත් පවතින අඩුපාඩු කිහිපය අනිවාර්යෙන් සකස් කල යුතු බැවින් ඒ කෙරේ අවධානය යොමු කරන ලෙසත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී සුභාෂිණි බණ්ඩාර මැතිනිය</u> 2018 වර්ෂය තුල ස්වෙච්ඡා සංවිධාන සඳහා රු 50,000 ක් වටිනා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට යෝජනා සම්මත කර ගත් නමුත් 05 දෙනෙකු සඳහා මෙතෙක් ප්‍රතිපාදන හිමි වී නැති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරියේදී අනිවාර්යෙන්ම ගරු මන්ත්‍රිතුමියගේ ඉල්ලීම් ඉටු කර දෙන බව ප්‍රකාශ කරමින් සභාවක් ලෙසට අප ඉතා වැදගත් තීන්දු තීරණ වලට එළඹිය යුතු කාල වකවානුවක් ලෙසට මෙම කාලය හැදින්විය හැකි බවත්, කාබනික ගොවිතැන සම්බන්ධයෙන් පවතින ගැටළු වලට ප්‍රාදේශීය සභාවක් ලෙස අප මැදිහත් විය යුතු බවත්, අප පුද්ගලිකව මැදිහත් වී ප්‍රදේශයේ ජනතාව මේ කෙරේ යොමු කර කීරික්කුලම කොම්පොස්ට් අංගනය හිමි වන තෙක් අවශ්‍ය නිෂ්පාදනයන් ලබා ගත යුත බවත්, කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම හෝ මීට පෙර පවත්වාගෙන ගිය ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමු කරනවාට වඩා වර්ථමාන ගැටළු වලට විසඳුම් සොයන්නේ කෙසේද යන්න සාකච්ඡා කල යුතු බවත් කමිටුවක් ලෙස අප ප්‍රධානීන් සමඟ සාකච්ඡා කිරීමේදී ඔවුන් විමසන ගැටළුවලට විසඳුම් සොයන්නේ කොසේද යන්න ගැටළු සහගත බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර අනතුරුව බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රිතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2021.06.22 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.10 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2021.07.20 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| ................................... | ......................................... |
| බී.එච් ප්‍රදීප් නිශාන්ත | එස්.බී කුමාරදාස මැතිතුමා |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |